www.wsws.org

ලෝක සමාජවාදී වෙබ් අඩවිය

හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# ශ්‍රී ලංකාව: ජනාධිපති ලේකම් රාජ්‍ය අංශය පුරා ඔත්තුකාර ඒකක පිහිටුවීමට යෝජනා කරයි

**Sri Lanka: Presidential Secretary calls for spy units throughout public sector**

**විජේ ඩයස් විසිනි**

**2009 ජුලි 6**

ජනාධිපති මහින්ද රාජපක්ෂගේ ලේකම් වන, ශ්‍රී ලංකාවේ සිවිල් සේවයේ ප්‍රධානත්වය දරන, ලලිත් වීරතුංග, දූෂනය සහ අකාර්යක්ෂමතාව පිටුදැකීමේ කඩතුරාව යටතේ සේවකයන් ගැන ඔත්තු බලනු පිනිස සෑම රාජ්‍ය අංශයේ වැඩපොලකම රහස් ඔත්තු ඒකක පිහිටුවන ලෙස යෝජනා කර තිබේ.

ආන්ඩුවට "සෑම රාජ්‍ය දෙපාර්තමේන්තුවක ම රහස් ඒජන්සියක්" සපයා දෙමින්, පොලිස් අපරාධ විමර්ශන දෙපාර්තමේන්තුවේ නිලධාරින් රහසේ යොදවනු ලැබේ යයි ජූනි 27 දා ශ්‍රී ලංකා පදනම් ආයතනයේ දී කල කතාවක දී ජනාධිපති ලේකම් යෝජනා කලේය. "රාජ්‍ය අංශයේ නාස්තියට, දූෂනයට සහ අක්‍රමිකතාවලට එරෙහිව සටන් වැදීමේ දී ඔත්තු සේවාවන්ට කේන්ද්‍රීය කාර්යභාරයක් ඉටු කල හැකි" බවට වීරතුංග විශ්වාසය පල කලේය.

රාජ්‍ය ආයතන නිරීක්ෂනය කිරීමට ජනාධිපති ජේ.ආර්. ජයවර්ධනගේ 1978-88 ආන්ඩුව විසින් ජාතික ඔත්තු කාර්යංශය (එන්අයිබී) යොදාගැනීම මතකයට නංවමින්, වීරතුංග කියා සිටියේ "දූෂනය පිටුදැකීමේ ආන්ඩුවේ මූලෝපායේ කොටසක් ලෙස" එවන් වැඩපිලිවෙලක් තමන් රාජපක්ෂට නිර්දේශ කර ඇති බවයි. එන්අයිබී යනු යුද, නාවික හා ගුවන් හමුදාවල සහ පොලීසියේ බුද්ධි අංශ ඒකාබද්ධ කල මිලිටරියේ පාලනය යටතේ පවතින ආයතනයක් වන අතර එහි ප්‍රධානියා කෙලින්ම ආරක්ෂක ලේකම්ට වාර්තා කල යුතුය.

දූෂනය පිටුදැකීම යනු මෙම ඔත්තු බැලීමේ ව්‍යාපෘතියේ සැබෑ එල්ලය වහංගු කරගැනීමේ තුනී ආවරනයකි. එනම්, රාජපක්ෂ තන්ත්‍රය ගැඹුරු වියදම් කප්පාදුවක්, රැකියා විනාශයක් හා වැඩ වේගවත් කිරීමක් ඉල්ලා සිටින තතු තුල රාජ්‍ය අංශයේ කම්කරුවන් විනයගත කිරීම හා බියගැන්වීමයි. ආන්ඩුව සතු ඩේලි නිව්ස් පත්‍රයේ ජූනි 30 දා කතුවැකිය තුල එය ප්‍රකාශයට පත් කෙරුනි.

කතුවැකිය, බෙදුම්වාදී දෙමල ඊලම් විමුක්ති කොටි (එල්ටීටීඊ) සංවිධානයට එරෙහි මිලිටරි ජයග්‍රහනයට සැඳහුම් කරමින්, "ප්‍රධාන යුද්ධය දැන් හමාර වී ඇති මේ දැන්" රාජ්‍ය අංශය තුල නාස්තියට හා අක්‍රමිකතාවලට එරෙහිව "පූර්න පරිමාන යුද්ධයක්" ප්‍රකාශයට පත් කිරීම ගැන රාජපක්ෂට ප්‍රශංසා කලේය. "රාජ්‍ය අංශය තුල තථ්‍යසමාන ලෙස ආයතනගත" වී ඇති දූෂනයට හා අල්ලසට එරෙහි "කාලෝචිත පියවරක්" ලෙස වීරතුංගගේ යෝජනාව අනුමත කරමින්, කතුවැකිය මෙසේ ප්‍රකාශ කලේය:

"එවන් සැකැස්මකට උපරිම සේවක නිමැවුම සහතික කරගනු පිනිස ආන්ඩුවේ දෙපාර්තමේන්තුවල ක්‍රියාකාරිත්වය අධීක්ෂනය ද කල හැකිය. තථ්‍ය වසයෙන් ගත් කල, එවන් බුද්ධි ආයතනයකට රාජ්‍ය අංශයේ අකාර්යක්ෂමතාවට බලපාන සමස්ත රෝග පද්ධතියම ගැන සොයාබැලිය හැකිය. අද රාජ්‍ය දෙපාර්තමේන්තු සහ සංස්ථා අලසකම, උදාසීනකම හා අකාර්යක්ෂමතාව සමග සමානාර්ථවාචී බවට පත්ව තිබේ."

කතුවැකිය සමාප්ත කර තිබුනේ, "රාජ්‍යයට ඉතිරි වන දැවැන්ත මුදල් ප්‍රමානය ගැන සඳහන් නොකරත් . . . වැඩපොලවල විනය ඉහල නැංවීම එවන් ව්‍යාපෘතියක් හරහා සාක්ෂාත් කරගත හැකි ප්‍රධාන වාසිවලින් එකක්" යයි සඳහන් කරමිනි.

මෙම යෝජනාව, දැනටමත් පනවනු ලැබ ඇති වැටුප් කැටිකිරීමකට අමතරව, කම්කරුවන්ගේ සේවා කොන්දේසිවලට හා මූලික ප්‍රජාතන්ත්‍ර අයිතීන්ට එරෙහි නව ප්‍රහාරයක් සලකුනු කරන බව එයින් පැහැදිලි කෙරෙයි. ආන්ඩුවට දේශපාලනිකව විරුද්ධ වන හෝ එහි අත්තකිලමථානු ඉල්ලීම්වලට ප්‍රතිරෝධය දැක්වීමට සැලසුම් කරන මොන යම් හෝ කම්කරුවන්ගේ නම් තන්ත්‍රයට සැපයීමේ කාර්යභාරය රහස් ඒජන්තයන්ට පැවරෙනු ඇත.

එල්ටීටීඊයේ පරාජයට ඉනික්බිතිව රාජපක්ෂ "ජාතිය ගොඩනැගීමේ ආර්ථික යුද්ධයක්" ප්‍රකාශයට පත් කිරීමේ අර්ථය මෙම නිවේදනය මගින් තව දුරටත්

අවධාරනය කෙරෙයි. දෙමල විරෝධී යුද්ධය වසර 26ක් තිස්සේ අඛන්ඩව ගෙන ගියේ වැඩ කරන ජනතාව වාර්ගික රේඛා ඔස්සේ බෙදීමේ විධික්‍රමයක් ලෙස ය. එල්ටීටීඊය මිලිටරිමය ලෙස තලා දැමීමෙන් පසුව, රාජපක්ෂ වටා සිටින දේශපාලන-මිලිටරි කල්ලිය සමස්තයක් ලෙස කම්කරු පන්තියට එරෙහි ප්‍රහාරය උත්සන්න කරමින් සිටී.

තන්ත්‍රය, බෞද්ධ ධූරාවලියේ හවුල්කාරිත්වය ද විපාර්ශ්වික පක්ෂවල නිවට සහයෝගය ද සහිතව සංවිධානය කෙරුනු සිය ජයග්‍රහනය පිලිබඳ උත්සව වල බියගැන්වීමේ දේශපාලන වාතාවරනය, සිංහල ප්‍රභූවේ පාලනයට එරෙහි මොන යම් හෝ ප්‍රතිරෝධයක් මැඩපැවැත්වීම පිනිස යොදාගැනීමට උත්සාහ කරයි. නිල උත්සවවලට පිටුපසින්, ආන්ඩුව, ගෝලීය ආර්ථික කඩාවැටීම මගින් උත්සන්න කෙරී ඇති, යුද්ධය මගින් නිර්මිත මූල්‍ය අර්බුදය පියවාගැනීමේ සිය ප්‍රයත්නයන් ඉහල නංවමින් සිටී.

දක්ෂිනාංශික *අයිලන්ඩ්* පත්‍රයේ ජූනි 30 දා කතුවැකියක්, රාජපක්ෂ කල්ලියේ වැඩෙන අත්තනෝමතික විධික්‍රම පිලිබඳව ප්‍රභූවේ ම කොටසක් තුල පවත්නා උත්සුකතා ද "දැවැන්ත වියදමකින් ලේවැකි යුද්ධයක් ජයගැනීමෙන්" පසුව ඒවා අසහනය ඇවිලවිය හැකි බවට පවත්නා භීතිය ද ප්‍රකාශයට පත් කලේය.

"ත්‍රස්තවාදයට එරෙහිව රට ලබාගත් ජයග්‍රහනයට ඔවුන් සිදු කල දැවැන්ත ප්‍රතිපදානය සම්බන්ධයෙන් රාජ්‍ය ඔත්තු සේවාවන් පැසසුම් ලැබිය යුතු බවට කිසිදු සැකයක් නැත. එහෙත්, රාජ්‍ය ආයතන ශුද්ධ කරනු පිනිස ඒවා යොදාගැනීම, නීති විරෝධී මත්පැන් කම්හලකට විරුද්ධව මල්ටි-බැරල් රොකට් විදින යොදාගැනීමට සම කල හැකිය. තර්ජනයකට ප්‍රතිචාර වසයෙන් මුදාහැරෙන බලවේග එයට සමානුපාතික විය යුතුය. එසේ නැතිනම්, "විසඳුම" අවසානයේ ගැටලුවේ කොටස් බවට පත් වනු ඇත."

බොහෝ සෙයින් අපකීර්තියට පත්ව ඇති ගෙස්ටාපෝ වැනි සංවිධානයක් සහ ජෝර්ජ් ඔවෙල් විසින් රචිත මනෝරාජික පීඩක සමාජ තන්ත්‍රයක් පිලිබඳ නවකතාව වන *Nineteen Eighty-Four* (1984) හි මෙන් "අත්තනෝමතික රාජ්‍යයක්" පැනනැගීම පිලිබඳව කතුවැකිය උත්සුකතා පලකලේය. "මේ රටට ලොකු අය්යා කෙනෙකු නැතිව කටයුතු කල හැකි බව අපි විශ්වාස කරමු. (අපට ඇති තරම් හා වැඩිපුර රාජපක්ෂ සහෝදරවරු සිටිති -- අපේ දකුනෙන් රාජපක්ෂලා, අපේ වමෙන් රාජපක්ෂලා, අප ඉදිරියෙන් රාජපක්ෂලා, අප පිටුපසින් රාජපක්ෂලා සහ අපට උඩිනුත් රාජපක්ෂලා).

*අයිලන්ඩ්* පත්‍රය සිංහල ස්වෝත්තමවාදය ඇවිලවීමෙහි හා රාජපක්ෂගේ යුද්ධයට සහයෝගය දීමෙහි ලා පෙරමුනේ ම සිට ඇත. දැන්, රාජපක්ෂ සහ ඔහුගේ ඥාතිමිත්‍රාදීන් බලය සියතෙහි සංකේන්ද්‍රනය කරගැනීමට ශීඝ්‍රයෙන් පියවර ගන්නා තතු යටතේ, ප්‍රභූවේ මෙම කොටස දේශපාලන අසහනය වර්ධනය වීමේ හැකියාව මෙන් ම කොලඹ සංස්ථාපිතය තුල ස්වකීය වරප්‍රසාද අහිමිවීම ගැන ද නොසන්සුන් වී තිබේ.

ජූලි 4 දා පල වූ තිසරනී ගුනසේකර විසින් ලියන ලද තවත් *අයිලන්ඩ්* ලිපියක්, රක්ෂන සංස්ථාව සහ සීමාසහිත ලංකා නාවික සේවා ආයතනය විකිනීම සම්බන්ධයෙන් ශ්‍රේෂ්ඨාධිකරනය විසින් වරදකරුවන් කරනු ලැබ ඇති ඇමතිවරුන්ට හා ජ්‍යෙෂ්ඨ නිලධාරින්ට එරෙහිව මොන යම් හෝ නෛතික ක්‍රියාමාර්ගයක් නොගැනීමෙන් පසුව, දූෂනයට විරුද්ධව සටන්වැදීම පිලිබඳ ආන්ඩුවේ කියාපෑම්වල විශ්වාසනීයත්වය නැති වී ඇති බව පෙන්වා දුන්නේය. යෝජිත "ඔත්තු සේවයේ" සැබෑ එල්ලය වන්නේ, "පක්ෂපාතිත්වය අඩු රජයේ සේවකයන් ගැන සුපරීක්ෂාකාරිත්වය පවත්වා ගෙන යාම සහ රාජ්‍යය මත ප්‍රථම පවුලේ (රාජපක්ෂලාගේ) පාලනය තව දුරටත් තද කිරීමයි."

ඔත්තු බැලීමේ ඒකක පිලිබඳ යෝජනාව, යුද්ධයේ අවසානයෙන් පසුව අඩු කෙරුනා නොව තීව්‍ර කෙරී ඇති මූලික නෛතික හා ප්‍රජාතන්ත්‍ර අයිතීන්ට එරෙහි ආන්ඩුවේ වඩා දුර දිග යන ප්‍රහාරයේ කොටසකි. රාජපක්ෂ පාලනාධිකාරය ව්‍යවස්ථාව උල්ලංඝනය කරමින් කිසිදු නඩු විභාගයකින් තොරව දෙමල සිවිල් වැසියන් 300,000කට ආසන්න ප්‍රමානයක් රඳවා ගෙන සිටින අතර, පුවත් පත් මන්ඩලය යලි බලාත්මක කිරීම මගින් සිය මාධ්‍ය වාරනය පුලුල් කොට අත්‍යසමාන හදිසි නීති බලතල සහ දරුනු ත්‍රස්තවාදය වැලැක්වීමේ පනත තවමත් පවත්වා ගෙන යයි.

ආන්ඩුව තුල පැලපදියම් වී සිටින "පැරනි වමේ" පක්ෂ ගැන කතා නොකලත්, එකදු "වමේ" පක්ෂයක් හෝ වෘත්තීය සමිති නිලධරයක් හෝ මෙම නවතම මර්දනකාරී පියවර ගැන වචනයක් වත් කතා කොට නැත. ඒ හෝ මේ ආකාරයෙන් දෙමල විරෝධී යුද්ධයට අනුගත වී සිටින ඔවුන් සියල්ලන් ම දැන් පශ්චාත්-යුද ආන්ඩුව සමග ස්වකීය සම්මුති ඇති කර ගැනීමට යොමු වී සිටින්නේ, ආන්ඩුව යුද්ධයේ හා ලෝක ආර්ථික පසුබෑස්මේ මූල්‍ය බර කම්කරුවන් මත පැටවීමට යත්න දරන තතු තුල ය.

එල්ටීටීඊයේ ජාතික බෙදුම්වාදයේ අවෘත-අන්තයක් සහිත ඉදිරිදර්ශනයට කිසිදු දේශපාලන සහනයක් නොදෙන අතර ම, දෙමල සුලුතරයට එරෙහි යුද්ධයට ස්ථිරසාරව විරුද්ධ වූ ද උතුරෙන් හා නැගෙනහිරෙන් හමුදා වහාම හා කොන්දේසි විරහිතව ඉවත් කරන ලෙස ඉල්ලා සිටියා වූ ද එකම දේශපාලන සංවිධානය සමාජවාදී සමානතා පක්ෂය (සසප) යි. සසප ආරම්භයේ පටන් ම අවධාරනය කල පරිදි,

වර්ගවාදී යුද්ධය ඉලක්ක කෙරුනේ සිංහල, දෙමල හා මුස්ලිම් සෑම ජනවර්ගයක ම වැඩ කරන ජනතාවට එරෙහිව ය.

රාජපක්ෂ තන්ත්‍රයේ මෑතම පොලිස්-රාජ්‍ය යෝජනා මෙම විශ්ලේෂනය තහවුරු කරන අතර උතුරේ හා නැගෙනහිර එල්ටීටීඊයට එරෙහි මිලිටරි ජයග්‍රහනය ජීවන මට්ටම්වලට හා මූලික අයිතීන්ට එරෙහි ප්‍රහාරය කෙතරම් ඉක්මනින් උත්සන්න කර ඇති ද යන වග පෙන්නුම් කරයි. සමාජවාදී හා ජාත්‍යන්තරවාදී වැඩපිලිවෙලකින් මෙහෙයවනු ලබන, පාලක ප්‍රභූවේ සියලු කන්ඩායම්වලින් ස්වාධීන වන, කම්කරු පන්තියම පමනක්, පීඩිත ජනතාවගේ සහයෝගය සහිතව මෙම වැඩෙන තර්ජනයන්ට මුහුන දී ඒවා පරාජය කිරීමට සමත් වනු ඇත.

© www.wsws.org